**සමූපකාර අතිරික්ත අරමුදල - 2015**

**------------------------------------------**

සමූපකාර අතිරික්ත අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර අතිරික්ත අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

දේපළ පිරියත හා උපකරණ යටතේ ශුද්ධ අගය ශුන්‍ය වශයෙන් සටහන් කර ඇති පිරිවැය රු.1,840,569 ක පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකාරී භාවිතයෙන් බැහැර කිරීමට තබා ඇති සේ වර්ගීකරණය කළ ඒවාද යන්න පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට භාවිතයේ නොමැති පිරිවැය රු. 189,001 ක්වූ පරිගණක මෘදුකාංග ශේෂ පත්‍රයේ අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට රු.507,671,763 ක් වූ සමුපකාර සමිති ණය සඳහා, අඩමාණ ණය වෙන්කිරීම රු. 1,349,763 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා පාරිභෝගික සංගමය වෙත ප්‍රදානය කළ ණය ආපසු ගෙවීම වෙනුවෙන් ඇපයට තැබූ ස්ථාවර තැන්පතුව අවලංගු කිරීමේදී 2014 ජනවාරි 01 දින සිට 2014 මාර්තු 06 දක්වා කාලපරිච්ඡේදයට අදාල පොලිය රු.207,296 ක් බැංකු ජංගම ගිණුමට බැර කර තිබුණද එය තවදුරටත් ලැබිය යුතු ශේෂයක් ලෙස 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සටහන් කර තිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විවිධ ණයගැතියෝ යටතේ දක්වා තිබුණු සමුපකාර සමිති ණය ශේෂය ලෙජරය හා උපලේඛනය සමග සැසඳීමේදී රු.86,662,204 ක වෙනසක් පැවතුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ සමුච්චිත අරමුදල් ගැලපීම වශයෙන් රු. 10,353,918 ක් සටහන් කර තිබුණද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීම් කළ ආකාරය පැහැදිලි නොකෙරුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍ර සටහන් 5 අනුව සහ උපලේඛන 1 අනුව ස්ථාවර වත්කම් පිරිවැයෙහි රු.164,157 ක වෙනසක් පැවතුණි.

**2.2.4 අවිනිශ්චිත ගිණුම**

අවිනිශ්චිත ගිණුම තුල ඇතුලත් වර්ෂ 10 කට වඩා පැරණි රු.6,041 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| සමුපකාර සමිති සඳහා දෙන ලද ණය සහ පොලිය | 573,120,858 | ශේෂ සනාථ කිරීම් |
| සමුපකාර අරමුදලින් ලැබිය යුතු මුදල | 5,029,486 | ශේෂ සනාථ කිරීම් |
| පොදු තැන්පත් ගිණුම | 2,645,004 | පොදු තැන්පත් ලෙජරය |
| ස්ථාවර තැන්පත් ඇප ණය | 99,049,481 | ණය ලිපිගොනු සහ ශේෂ සනාථ කිරීම් |
| අගරු චෙක්පත් | 768,971 | අගරු චෙක්පත් ලේඛනය / බැංකු ප්‍රකාශන |
| ඇවර ගිණුම | 2,620,473 | පිළියල කරන ලද ඇවර ගිණුමේ පිටපතක්. |
| ගෙවිය යුතු භාණ්ඩාගාර අරමුදල | 150,000 | ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උපලේඛන |
| ගෙවිය යුතු ජාතික භාරකාර අරමුදල | 3,871,256 | ශේෂ තහවුරු කිරීම් සහ විස්තරාත්මක උපලේඛන |
| | 687,255,529 | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාරයෙන් අයවිය යුතු ණය පොලී රු.81,871,370 ක් සහ අතිරික්ත අරමුදලට ගෙවිය යුතුව පවතින රු.6,017,550 ක්, වර්ෂ 04 ක සිටද, ගෙවිය යුතු වගකීම් ගිණුම් 05 ක ශේෂයන්හි එකතුව රු.1,020,235 ක් වසර 5 කට වැඩි කාලයක සිටද නිරවුල් නොවී තිබුණි.

(ආ) සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය වෙත 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලබාදී තිබූ රු.143,919,037 ක ණය මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට රු.119,027,924 ක් අයවිය යුතුව පැවතුණි. තවද එම සංගමය වෙත කෝප් සිටි සුපිරි වෙළෙඳසැල් 04 ක් ආරම්භ කිරීම සඳහා 2010 සහ 2011 වර්ෂවලදී අරමුදලින් ලබාදුන් එකතුව රු.12,000,000 ක ණය මුදලින් 2015 දෙසැම්බර් 31 වන විට රු.3,786,400 ක ණය වාරික හා ඊට අදාල පොළිය රු.1,517,520 ක් අයකර ගෙන නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේදී සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය වෙත ලබාදුන් රු.19,550,000 ක ණය මුදල හා ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය වෙත පවරා ගත් සී/ස රබර් සමුපකාර සමිතිය වෙත ලබාදී තිබුණු රු.3,600,000 ක ණය මුදල 2015 දෙසැම්බර් 31 දක්වා අයවී නොතිබුණි.

(ඈ) සී/ස කුරුණෑගල සමුපකාර ආරෝග්‍යශාලා සමිතිය වෙත නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2012 සැප්තැම්බර් 26 දින රු. 100,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර ණය ගිවිසුම ප්‍රකාරව 2015 සැප්තැම්බර් 26 වන විට ණය මුදල ගෙවා අවසන් කළ යුතු වුවද 2016 දෙසැම්බර් 31 දින වනවිටත් ණය වාරික හා පොළී වශයෙන් ලැබී තිබුණේ රු.1,000,000 ක් පමණි.

(ඉ) සී/ස නිකවැරටිය සංවර්ධන සමුපකාර සමිතිය වෙත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2014 ජනවාරි 17 දින රු.4,000,000 ක පොලී රහිත ණය මුදලක් ලබාදී තිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මාස 03 කින් අවසන් කර ලැබෙන ආදායමින් හෝ සමුපකාර සමිතියට එකතු වන මුදල්වලින් යන දෙකෙන් පළමුව ලැබෙන මුදලින් එකවර ණය මුදල ගෙවා නිදහස් වන බවට ණය ගිවිසුම් ප්‍රකාරව එකඟතාව පලකර තිබුණද 2016 දෙසැම්බර් 31 දිනට රු.2,300,000 ක ණය ශේෂයක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

(ඊ) ගාල්ල සමුපකාර ආරෝග්‍යශාලා සමිතියේ රෝහල ඉදිකිරීම සඳහා 2013 අප්‍රේල් 03 දින රු.50,000,000 ණය මුදලක් ලබා දී තිබුණි. ණය ගිවිසුම අනුව වසරක් ඉක්මවීමට පෙර මෙම ණය මුදල ආපසු අය විය යුතු වුවද 2015 දෙසැම්බර් 31 වන විට කිසිදු ණය වාරික මුදලක් අයවී නොතිබුණි. ගිවිසුම් ප්‍රකාරව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවල මාසික වාර්තාද ලැබී නොමැති අතර පසු විපරම් කටයුතුද සිදු කර නොතිබුණි.

(උ) කොබෙයිගනේ සමුපකාර සමිතියට අයත් ඉන්ධනහලක් නවීකරණය සඳහා 2013 අප්‍රේල් 05 දින ලබාදුන් රු.10,000,000 ක ණය මුදලින් ණය ගිවිසුම ප්‍රකාරව 2014 අප්‍රේල් සිට 2015 දෙසැම්බර් දක්වා රු,4,374,999 ක ණය වාරික අයවිය යුතු වුවද අය වී තිබුණේ රු.1,104,510 ක් පමණි. ඒ අනුව හිඟ ණය වාරික රු.3,270,489 ක් අය විය යුතුව තිබියදී 2014 ඔක්තෝබර් 10 දින නැවත මෙම කාර්යය සඳහා රු.7,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. මෙම ණය මුදල මාසිකව රු.150,000 ක වාරික වශයෙන් අයවිය යුතු වුවද, 2015 දෙසැම්බර් 31 දින දක්වා අයවී තිබුණේ රු.368,170 ක් පමණි.

(ඌ) සී/ස නිකවැරටිය සමුපකාර සංවර්ධන සමිතියට මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2013 ජනවාරි 31 දින රු.19,500,000 ක ණය මුදලක් ලබා දී තිබුණු අතර ණය ගිවිසුම ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු වාරික මුදල රු. 6,175,000 ක් වුවද 2015 දෙසැම්බර් 31 දිනවන විට අය වී තිබුණේ රු.1,300,000 ක් පමණි. ණය ගිවිසුම ප්‍රකාරව යන්ත්‍රය මිලට ගැනීමෙන් අපේක්ෂිත දෛනික ලාභය හා නඩත්තු කටයුතු පිළිබඳව යන්ත්‍රය මිලදී ගෙන මාස 03 කට වරක් සමුපකාර දෙපාර්තමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවත්, ලිපිගොනුව අනුව එවැනි වාර්තාවක් ලැබී නොතිබුණි.

(එ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් හා නවීකරණය සඳහා 2014 නොවැම්බර් 10 දින ලබා දී තිබූ රු.25,000,000 ක ණය මුදලට අදාලව ගිවිසුමකට එළඹ නොතිබූ අතර එම ණය මුදල සම්පූර්ණයෙන්ම තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

(ඒ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අක්‍රිය සමිති බවට හඳුනාගෙන ඇති සමුපකාර සමිති 12 ක් වෙත 1990 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුල ලබා දී තිබූ ණය මුදල්වලින් 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.22,354,358 ක ණය ශේෂයක් අයකර නොවී පැවති අතර ඊට අදාල ලැබිය යුතු පොලී මුදල්වල එකතුව රු.8,728,473 ක් විය.

(ඔ) 2011 වර්ෂයේදී සමුපකාර සංවර්ධන අරමුදලට ලබා දුන් රු. 45,500,000 ණය මුදලින් 2015 දෙසැම්බර් 31 වන විටත් රු.40,000,000 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි.

(ඕ) 2006 වර්ෂයේ භාණ්ඩාගාර අරමුදල් ගිණුම ඇවර කිරීමෙන් පසු සමුපකාර අතිරික්ත අරමුදල වෙත පවරන ලද එකතුව රු.15,880,475 ක්වූ වත්කම් හා වගකීම් ශේෂ 05ක් වසර 09 ක් ගත වී ඇතත්, නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4: 3 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ කාර්යසාධන වාර්තාව සමඟ සමුච්චිත අරමුදලේ වෙනස්කම් දැක්වෙන ප්‍රකාශයක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිටපතක් සහිතව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.89,477,486 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.40,735,573 ක අතිරික්තයක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.48,741,913 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමුපකාර සමිති ණය පොලී ආදායම් රු.16,716,069 කින් වැඩිවීම හා ආධාර ගෙවීම්, ක්ෂයවීම් වෙනත් වියදම් හා අඩමාණ ණය රු.14,911,506 කින් අඩුවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් නිවේදනය මගින් පළ කරන ලද සමුපකාර රීතින්හි 44 වගන්තිය ප්‍රකාරව අතිරික්ත අරමුදලෙහි මුදල් රෙජිස්ට්‍රාර්තුමා විසින් පහත කාර්යයන් සඳහා යෙදවිය හැකිය.

(අ) ඕනෑම ලියාපදිංචි කරන ලද ප්‍රාථමික සමිතියක කොටස් මිලට ගැනීමෙන් හෝ රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කල හැකි වෙනත් ආකාරයකට හෝ එවැනි සමිතියකට ආධාර කිරීම.

(ආ) අතිරික්තයක් ඇති වී තිබෙන දිස්ත්‍රික්කයේ පිහිටි ඕනෑම ලියාපදිංචි කරන ලද සමිතියකට යම්කිසි ස්ථාවර වත්කම් මිලයට ගැනීමට ආධාර කිරීම.

(ඇ) ඇවරකරුවකුට විරුද්ධව ඇති සිවිල් නඩුවකදී ඔහුගේ නිදහසට ක්‍රියා කිරීමට ඔහුට ආධාර කිරීම.

(ඇ) සමුපකාර සමිති පනතේ 3 (1) (ඇ) හා (ඈ) වගන්ති අනුව පිහිටුවන ලද ඕනෑම ලියාපදිංචි කළ සමිතිවලට ආධාර කිරීමේ කටයුත්ත සඳහා පිහිටුවන ලද වෙනත් ආයතනයකට හෝ ආධාර කිරීම.

රීති ප්‍රකාරව සමුපකාර අතිරික්ත අරමුදලින් ණය ලබා දිය හැක්කේ සමුපකාර සමිතිවලට පමණක් වුවද ඊට පටහැනි ලෙස 2013 වර්ෂයේදී ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වෙත සියයට 16 ක පොලී අනුපාතය මත වාරික 08 කින් ගෙවා නිම කිරීමේ පදනම මත රු.75,000,000 ක ණය මුදලක් ලබා දී තිබුණි. ණය මුදල් ආපසු ගෙවීමේ මූල්‍යමය ශක්‍යතාවය පිළිබඳ නොසලකා මෙම ණය ලබා දී තිබුණු අතර 2015 දෙසැම්බර් 31 වන විට රු.52,249,999 ක් අයවිය යුතුව පැවතුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ස්ථාවර තැන්පතු කල්පිරෙන අවස්ථාවේදී ලැබෙන පොලී ආදායමින් බැංකුව විසින් අයකල රු.848,851ක් වූ රඳවා ගැනීමේ බදු, මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණයගැතියෝ යටතේ ලැබිය යුතු ස්ථාවර තැන්පත් රඳවා ගැනීමේ බදු වශයෙන් දක්වා තිබුණි. 2016 වර්ෂයේදී එයින් රු.452,004 ක් බැංකුව විසින් ආපසු ගෙවා තිබුණු අතර තවදුරටත් අයවිය යුතුව පවතින රු.396,847ක් බැංකුවෙන් ආපසු අයකර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට සමුපකාර සමිති වෙත රු.771,817,006 ක් ණය වශයෙන් ලබා දී තිබුණද මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කටයුතු සිදු කිරීම දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.594,333,967 ක් හෙවත් ලබා දුන් ණය මුදලින් සියයට 77 ක ප්‍රමාණයක් අයවීමට තිබුණි. මෙම ණය සඳහා අයවිය යුතු පොලිය රු.168,087,855 ක් විය.

(ඇ) 1991 වර්ෂයේ අවස්ථා 2 කදී එකතුව රු 1,500,000 ක ණය මුදලක් සී/ස මධ්‍යම පළාත් විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබා දී තිබූ අතර, 2016 දෙසැම්බර් 31 දින දක්වා ඉන් කිසිදු මුදලක් අයවී නොතිබුණි. තවද එම සමිතිය අක්‍රීය සමිතියක් බව අනාවරණය වී ඇති අතර අය වීමට ඇති ණය ශේෂය ලෙස ගිණුමේ දක්වා තිබුණේ රු.150,000 ක් පමණි.

(ඈ) 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සී/ස උඩපළාත වි.සේ.ස. සමිතියෙන් අයවීමට ඇති ණය ශේෂය රු.2,470,000 ක් වූ අතර මෙම සමිතිය දැනටමත් ඈවර කර ඇති බව අනාවරණය වී ඇති බැවින් එම ණය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ඉ) සී/ස නොච්චියාගම සහ සී/ස හොරොව්පතාන වි.සේ.ස. සමිති ඈවර කර ඇති බව අනාවරණය වී ඇති බැවින් මෙම සමිති දෙක සඳහා ලබා දී ඇති ණය මුදල්වලින් 2015 දෙසැම්බර් 31 දිනට අය විය යුතු පිළිවෙලින් රු.241,666 සහ රු.1,000,000 ක් වූ ණය ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ඊ) සී/ස ශ්‍රී ලංකාවේ කුකුලන් ඇතිකරන්නන්ගේ සමුපකාර සමිති සංගමයේ ලියාපදිංචිය 2003 වර්ෂයේදී අවලංගු කර ඈවර කටයුතු සඳහා ඈවරකරුවකුද පත් කර වසර 12 ක් ගතවී ඇතත් ඈවර කටයුතු අවසන් කර නොතිබුණි. මෙම සමිතිය වෙත අරමුදලින් ලබා දුන් ණය මුදලින් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 100,000 ක් හා ගිවිසුම් ප්‍රකාර ඒ සඳහා ලැබිය යුතු පොලිය වූ රු. 172,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) මානව සම්පත් සමූපකාර සමිතිය ඈවර කිරීමේ කටයුතු වෙනුවෙන් 2007 වර්ෂයේ සිට ප්‍රවර්තන වර්ෂය දක්වා අවස්ථා කිහිපයකදී ලබාදී තිබුණු පරිපාලන වියදම්, තීරක ගාස්තු, නීති වියදම්, ගමන් වියදම්, සංග්‍රහ, රැස්වීම්, විගණන කටයුතු සඳහා සහ 2010 වර්ෂයේ තැන්පතු නිදහස් කිරීම සඳහා ගෙවන ලද රු.56,901,825 ක් එක් එක් වර්ෂවල වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ ලැබිය යුතු වශයෙන් ගිණුම්ගත කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අතිරික්ත අරමුදලට අදාලව විගණන වැඩසටහනක් පිළියෙල කර විගණනය සිදුකර තිබුණද, මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ජ'නල් සටහන් පිළියෙල කිරීම හා අනුමත නොකිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| (ඇ) ණය පාලනය | (i) සමුපකාර සමිති වල මූල්‍ය ශක්‍යතාවය පරීක්ෂා නොකර ණය ලබාදීම. |
| | (ii) ණය ලබා දීමේදී ගිවිසුම්වලට එළඹ නොතිබීම හේතුවෙන් ණය අයකර ගැනීමේදී ගැටළු මතු වී තිබීම. |
| | (iii) ලබාදුන් ණය පිළිබඳ සිදුකළ යුතු පසු විපරම් කටයුතු වල දුර්වල මට්ටමක පැවතීම. |